හෙක්ටර්
කොබ්බෑකඩුව
ගොවිකටයුතු
පර්යේෂණ හා පුහුණු
කිරීමේ ආයතනය

# ගොවිකටයුතු

## පුවත් හසුන

වෙළුම 41 | 2017 පළමු හා දෙවැනි කලාප | පිටු 08 | ISSN 1991-040 x



# වස විසෙන් තොර රටක් - තිරසර හෙට දිනක්

ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක වස විස නැති රටක් සඳහා වූ තුන් අවුරුදු සැලැස්මේ ඉලක්කවලට සමගාමීව සංවිධානය කළ 'තිරසර ලංකා' ජාතික මංගල්‍යය මාර්තු 31වන දින සිට අප්‍රේල් 04වන දින දක්වා බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්වුණි.




ශ්‍රී ලාංකික ජනතාවට තම ජීවන රටාව තිරසර ක්‍රමවේදයන් අනුව සකසා ගන්නා ආකාරය පිළිබඳව පෙන්වා දීම මෙම ප්‍රදර්ශනයේ අරමුණයි.

රාජ්‍ය, රාජ්‍ය නොවන ආයතන, පෞද්ගලික ආයතන, නව නිපැයුම්කරුවන්, කුඩා ව්‍යාවසායකයින්, ප්‍රජා මූල සංවිධාන, සමුපකාර සමිති, ගොවි සංවිධාන සහ තවත් නිෂ්පාදකයින් මෙන්ම මෙයට අදාළ අනෙකුත් පාර්ශවයන් මහජනතාවට තම ජීවන රටාව තිරසර ආකාරයෙන් හැඩගස්වා ගැනීමට අවශ්‍ය අදහස් හා ක්‍රමවේද ඉදිරිපත් කර තිබුණි. දිළිඳුකම, ගොවිතැන, සෞඛ්‍ය, අධ්‍යාපනය, ස්ත්‍රීපුරුෂ සමානාත්මතාව, ජලය, බල ශක්තිය, රැකියා, කර්මාන්ත, ඇති නැති පරතරය, පරිභෝජනය, දේශගුණික විපර්යාස, සාගර, ජෛව විවිධත්වය වැනි විවිධ තේමා සහ ක්ෂේත්‍ර ආවරණය වන පරිදි ප්‍රදර්ශන කුටි සකස් කර තිබුණි. එමෙන්ම එක් දිනයකට එක් තේමාවක් යටතේ ප්‍රදර්ශනය සංවිධානය කර තිබූ අතර විවිධ අලෙවි හා ප්‍රදර්ශන කුටි 1000ක් පමණ ප්‍රදර්ශන භූමිය පුරා ස්ථාපිත කර තිබුණි. එක් එක් අමාත්‍යාංශයේ වෙළඳ කුටි ආකර්ෂණීය ලෙසත් ජනතාවට පුළුල් දැනුමක් ලබා ගැනීමට පහසු වන ලෙසත් ඉදිරිපත් කර තිබෙනු දක්නට ලැබුණි. ඒ අතුරින් විශේෂ අවධානයක් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ ප්‍රදර්ශන කුටියට යොමු වූ අතර ප්‍රදර්ශනය පැවැති දින පහ පුරාවට අප ආයතනයේ ප්‍රකාශන මිල දී ගැනීමට ජනතාවට අවස්ථාව සලසා තිබුණි. එසේම පර්යේෂණ ව්‍යාපෘති සහ පුහුණු වැඩසටහන් පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශවයන් සඳහා ඊට අදාළ තොරතුරු ලබා දීමට ද ප්‍රදර්ශන කුටියේ සිටි කාර්යමණ්ඩලය යුහුසුළු විය.

ඡායාරූපය ඉහළ - හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් පවත්වා ගෙන ගිය ප්‍රදර්ශනය කුටිය වෙත පැමිණි ජනපති මෛත්‍රීපාල සිරිසේන, ඇමැති නිමල් සිරිපාල ද සිල්වා, කෘෂිකර්ම රාජ්‍ය ඇමැති වසන්ත අළුවිහාරේ සහ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් බී.වී. බන්දුලසේන යන මහත්වරුන් සහ අප ආයතනයේ නිලධාරීන් කිහිප දෙනකු ඡායාරූපයේ සිටිති.

# ශ්‍රී ලංකාවේ තෝරාගත් දිස්ත්‍රික්ක කිහිපයක විවිධ සහල් විශේෂ සඳහා පවතින පාරිභෝගික රුචිකත්වය සහ පාරිභෝජන රටාවන් අධ්‍යයනය

**ජනතාව** අතර බෝ නොවන රෝග ව්‍යාප්තිය වැඩිවීමත් සමඟ සෞඛ්‍යාරක්ෂිත ආහාර රටාවක් පිළිබඳ වැඩි අවධානයක් යොමු වී තිබේ. විශේෂයෙන් මෑතක සිට සහල් පාරිභෝගිකයෝ ද විවිධ සහල් ප්‍රභේද අත්හදා බැලීමේ නැඹුරුවක් පෙන්නුම් කරති.

විවිධ සහල් ප්‍රභේද මිල දී ගැනීම සඳහා පවතින පාරිභෝගික රුචිකත්වයන් සහ පාරිභෝගිකයින්ගේ මිල දී ගැනීමේ චර්යාවන් විමර්ශනය කිරීමේ අරමුණින් අලෙවි, ආහාර ප්‍රතිපත්ති අංශයේ පර්යේෂකයින් පිරිසක් විසින් මෙම අධ්‍යයනය සිදු කර තිබේ. විවිධ සහල් වර්ග සඳහා පවතින පරිභෝජන රටා හඳුනා ගැනීම සහ පාරිභෝගික රුචිකත්වය සඳහා හේතු සොයා බැලීම විශේෂිත අරමුණුය.

ගම්පහ, කොළඹ, මොණරාගල, රත්නපුර, මාතලේ සහ යාපනය යන දිස්ත්‍රික්ක හයේ පාරිභෝගිකයින් 600කගේ සහභාගීත්වය අධ්‍යයනය සඳහා ලබා ගෙන ඇත. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනී රෝෂිණි රඹුක්වැල්ල මිය පර්යේෂණයේ සම්බන්ධීකරණ කටයුතු සිදු කළ අතර ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී දුමින්ද ප්‍රියදර්ශන මහතා සහ පර්යේෂණ නිලධාරී නාලක විජේසූරිය යන මහත්වරුන්ගේ සම පර්යේෂකත්වයෙන් අධ්‍යයනය සිදු කර තිබේ.

අධ්‍යයන වාර්තාව මේ වන විට ප්‍රකාශයට පත් වී ඇති අතර අධ්‍යයනය පිළිබඳ උනන්දුවක් දක්වන අයෙකුට ආයතනික අලෙවි අංශයෙන් එය මිල දී ගැනීමට හැකි අතර අලෙවි අංශයේ පර්යේෂකයින් සම්බන්ධ කර ගැනීමෙන් වැඩිදුර තොරතුරු දැන ගත හැකිය.

# වී මිලදී ගැනීමේ සහ පශ්චාත් තොග කළමනාකරණයේ ගැටලු

**වෙළඳපළ** තුළ වී සහ සහල් අලෙවිකරණ ක්‍රියාවලිය ස්ථාවරව පවත්වා ගැනීම සඳහා රජය මැදිහත් වීම බොහෝ අවස්ථාවල සිදු වේ. ගොවීන්ට වී සඳහා සහතික මිලක් ලබා දීමට සහ පාරිභෝගිකයින්ට සහල් පහසු මිලට ලබා ගැනීමට හැකියාව ලබා දීම රජය මෙලෙස මැදිහත් වීමේ ප්‍රධාන අරමුණු වේ.

වී අලෙවිකරණයේ සමස්ත තත්ත්වය හඳුනා ගැනීම සහ වී අලෙවිය සඳහා රජය මැදිහත් වීමේ වත්මන් ගැටලු විමර්ශනය කිරීම පිණිස අලෙවි, ආහාර ප්‍රතිපත්ති සහ කෘෂි ව්‍යාපාර අංශය විසින් මෙම අධ්‍යයනය සිදු කර තිබේ. එම අංශයේ පර්යේෂණ නිලධාරී ඩබ්.ඒ.එන් විජේසූරිය මහතාගේ සම්බන්ධීකරණයෙන් සහ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරීන් වන රුවිනි විද්‍යානපතිරණ, දුමින්ද ප්‍රියදර්ශන යන මහත්ම මහත්මීන් ද පර්යේෂණ නිලධාරිනී ජයමිණි චම්පිකා මෙනෙවියගේ සම පර්යේෂකත්වයෙන් ද අධ්‍යයනය සිදු කර තිබේ.

මෙම අධ්‍යයනය සම්පූර්ණයෙන් ම ද්විතීයික දත්ත සහ ප්‍රධාන තොරතුරු සපයන්නන් සමඟ කළ සම්මුඛ සාකච්ඡා පාදක කර ගෙන සිදු කළ එකකි. පර්යේෂණ වාර්තාව මේ වන විට ප්‍රකාශයට පත් වී තිබේ.



**වගා කටයුතු** සඳහා බීජ තෝරා ගැනීමේ දී ගොවීහු විවිධ කරුණු පිළිබඳව සැලකිලිමත් වෙති. දේශීය බීජ මෙන්ම ආනයනික බීජ ද තෝරා ගැනීමේ අවස්ථාව ගොවීන්ට ඇති අතර ඉහළ අස්වැන්නක් ලබා ගෙන වැඩි ආදායමක් ලබා ගැනීම වාණිජ මට්ටමින් වගා කටයුතුවල නිරතවන ගොවීන් ගේ අභිප්‍රායයයි.

## දේශීය හා ආනයනික දෙමුහුන් බීජ භාවිතයෙන් ශ්‍රී ලංකාවේ එළවළු නිෂ්පාදනය


කෘෂිකාර්මික සම්පත් කළමනාකරණ අංශයේ පර්යේෂණ නිලධාරී ප්‍රසන්න විජේසිංහ මහතාගේ සම්බන්ධීකරණයෙන් හා පර්යේෂණ නිලධාරිනි රසිකා විජේසිංහ මියගේ සම පර්යේෂකත්වයෙන් දෙමුහුන් බීජ භාවිතයෙන් ශ්‍රී ලංකාවේ එළවළු නිෂ්පාදනය පිළිබඳව සිදු කර ඇති මෙම පර්යේෂණය ඉතා වැදගත් සොයා ගැනීම් රැසකින් සමන්විතය. දෙමුහුන් බීජ තෝරා ගැනීමේ දී ගොවීන්ගේ රුචිකත්ව නිර්නායක මත වගා කිරීමේ දී දේශීය හෝ විදේශීය වශයෙන් කවර ප්‍රභේදයකට කැමැත්තක් දැක්වී ද යන්න අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනයේ අරමුණ වී තිබේ. දේශීය ප්‍රභේදයන්ට සාපේක්ෂව ආනයනික ප්‍රභේද වගා කිරීමේ දී යන වියදම් සහ ප්‍රතිලාභ සංසන්දනය කිරීම දෙවන අරමුණ වූ අතර ශ්‍රී ලංකාවේ එළවළු බීජ සැපයුම් අංශය ශක්තිමත් කිරීම පිණිස උපායමාර්ග යෝජනා කිරීම ද මෙහි තවත් අරමුණකි. මෙම අධ්‍යයනයේ පර්යේෂණ වාර්තාව ද ඉතා ඉක්මනින් මුද්‍රණ ද්වාරයෙන් නිකුත් වීමට නියමිතය.

## කෘෂි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන ඇගයීම

**කෘෂිකර්ම** දෙපාර්තමේන්තුවේ "කෘෂි ව්‍යවසායකත්ව සංවර්ධන අංශය" විසින් නියමු ව්‍යාපෘතියක් ලෙස 2013-2015 වර්ෂවල දී ක්‍රියාවට නංවන ලද 'ගොවි ව්‍යාපාරික පාසල' යටතේ (යැපුම් කෘෂිකර්මාන්තයේ නිරත වී සිටි) ගම්බද හා නාගරික ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයම ප්‍රායෝගික ඉගැනුම් ක්‍රියාවලියක් යටතේ කෘෂි ව්‍යවසායකයන් වශයෙන් නිෂ්පාදන කාර්යයට දායක කරවීම මඟින් වෙනස් කුඩා ව්‍යවසායන් ගණනාවක් බිහි කර තිබේ.

ගොවි ව්‍යාපාරික පාසල සහ කෘෂිසේවා පියස වැඩසටහන් අධ්‍යයනය කර එහි පවත්නා අඩුපාඩු මඟ හරවා ඒවා තිරසාර ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපත්තිමය නිර්දේශ ඉදිරිපත් කිරීමේ අරමුණින් මෙම අධ්‍යයනය සිදු කර ඇත.

අනුරාධපුර, පොළොන්නරුව, කුරුණෑගල, බදුල්ල, මොණරාගල, මහනුවර, පුත්තලම, කෑගල්ල, ගම්පහ සහ කොළඹ යන දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කරන ලද ගොවි ව්‍යාපාරික පාසල් වැඩසටහන්හි කෘෂි ව්‍යවසායකයින් 74 දෙනෙකු සහ කෘෂි සේවා පියස 10ක නියැදියන් ආශ්‍රයෙන් මෙම අධ්‍යයනය සිදු කර තිබේ. අධිපර්යේෂක ආර්.එල්.එන් ජයතිස්ස මහතා විසින් මෙම අධ්‍යයනය සිදු කර තිබේ. පර්යේෂණ වාර්තාව ප්‍රකාශයට පත් වී ඇති අතර ආයතනයේ අලෙවි අංශයෙන් දැන් මිල දී ගත හැකිය.






# ප්‍රතිපත්ති සම්පාදනය සඳහා විද්වත් කතිකාවත

**ශ්‍රී ලංකාවේ** ගෝලීය විචලතා හමුවේ තිරසරභාවය සඳහා කෘෂි පර්යේෂණ - ප්‍රතිපත්ති - තාක්ෂණික නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා වූ ව්‍යාපෘතියේ පර්යේෂණ සොයා ගැනීම් ප්‍රතිපත්ති සම්පාදකයින් වෙත බෙදා හැරීමේ අරමුණින් විද්වත් කතිකාවක් සංවිධානය කර තිබුණි.

2017 ජුනි 20 දින හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ නාරායනසාමි ශාලාවේ දි පැවැත්වුණු සමුළුව සඳහා ක්ෂේත්‍රයට සම්බන්ධ විද්වත්හු රැසක් සහභාගී වූහ. කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් ඩී.වී බන්දුලසේන මහතාගේ ප්‍රධානත්වයෙන් කතිකාව ආරම්භ විය. ව්‍යාපෘතිය සඳහා මූල්‍ය අනුග්‍රාහකත්වය දැක් වූ ගෝලීය විචලතා පර්යේෂණ සඳහා වූ ආසියා පැසිෆික් ජාලයේ දේශීය නියෝජිතයෝද මේ අවස්ථාවට සහභාගී වූහ.

මෙහි පළමු තාක්ෂණික සැසියේ මුලසුන දැරුවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වන හා පාරිසරික විද්‍යා දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ප්‍රශාන්ති ගුණවර්ධන මහත්මිය සහ කොළඹ විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය පී.එම් දුනුසිංහ මහතා විසින්ය. ව්‍යාපෘතියේ සොයා ගැනීම් ඉදිරිපත් කිරීම ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරීන් වන එස්. ඇපාසිංහ, සුසිලා ලූර්දු සහ පර්යේෂණ නිලධාරීන් වන චින්තක ජයසූරිය, ප්‍රසන්න විජේසිංහ, රසිකා විජේසිංහ යන මහත්ම මහත්මීන් විසින් සිදු කළ අතර උක්, ලූනු, රටකජු, මුං ඇට, බඩඉරිඟු වගාවන්ට විශේෂිතව මෙම අධ්‍යයන සිදු කර තිබේ.



ව්‍යාපෘතිය පිළිබඳ සාරාංශයක් ව්‍යාපෘති නායක අධි පර්යේෂක රේණුකා වීරක්කොඩි මහත්මිය විසින් සිදු කළාය.

පර්යේෂණයේ සොයාගැනීම් හා ඉදිරිපත් වූ නිර්දේශ පිළිබඳ පුළුල් සංවාදයකට සහ නව අදහස් දැක්වීමට ද ඉඩකඩ වෙන් වී තිබූ අතර සමස්තයක් ලෙස ඵලදායී සංවාදයක් ගොඩ නැගිණි.

ව්‍යාපෘතියේ වෙබ් අඩවිය වන www.apnsustanabilityknowledge.com හඳුන්වා දීමද මෙහි දී සිදු විය.

ඡායාරූප- ඉහළ- හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ අධ්‍යක්ෂ හපුතන්ත්‍රී ධර්මසේන මහතා විද්වත් කතිකාව අමතමින්. කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් ඩී.වී බන්දුලසේන මහතා ද ඡායාරූපයේ සිටියි.

පහළ- විද්වත් කතිකාවතට එක් වූ විද්වතුන්

පුහුණු පුවත්



## ධනාත්මක ආකල්ප සංවර්ධන පුහුණු වැඩසටහන

**ආයතනයේ** කාර්යමණ්ඩලයේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය නංවාලීමේ අරමුණින් ධනාත්මක ආකල්ප සංවර්ධනය කිරීමේ විශේෂ වැඩමුළුවක් මැයි මස 24 වන දින නව ශාලාවේදී පැවැත්වුණි. ප්‍රවීණ දේශකයෙකු හා පෞරුෂත්ව පුහුණු උපදේශකයෙකු වන මොහාන් පල්ලියගුරු මහතා විසින් වැඩමුළුව මෙහෙයවනු ලැබිණි. ආයතනයේ සියලුම මාණ්ඩලික නිලධාරීන් සඳහා පැවති මෙම වැඩමුළුව රාජකාරීමය ඵලදායීතාවය ඉහළ නැංවීමට මෙන්ම පෞද්ගලික ජීවිතයේ අරමුණු ජය ගැනීමට ද වැදගත් වූ ආකල්ප සංවර්ධන ප්‍රයත්නයක් ලෙස හැඳින්විය හැකිය.

## ගොවි කාන්තාවන් සවිබල ගැන්වීමේ පුහුණු වැඩසටහන

**මානව** සම්පත් හා ආයතනික සංවර්ධන අංශය විසින් දිවයින පුරා සිදු කරන පුහුණු වැඩසටහන් අතර ගොවි කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා ක්‍රියාත්මක පුහුණු වැඩසටහන කැපී පෙනේ. මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සංවර්ධන බල ප්‍රදේශයන්හි විසිරී සිටින ගොවි කාන්තාවන් 540 දෙනෙකුට ඇතිමලේ, සියඹලාණ්ඩුව, බිබිල, තණමල්විල, සෙවණගල හා මොණරාගල යන ප්‍රදේශයන්හි පැවති වැඩසටහන් තුළින් පුහුණුව ලබා දෙන ලදී. මොණරාගල දිස්ත්‍රික්කයේ කෘෂිකර්ම උපදේශකවරුන් සහ විෂයබද්ධ නිලධාරීන්ගේ සහය ද මේ සඳහා ලැබුණි.



මැයි මස 29 දින සිට ජුනි මස 01වන දින දක්වා මාතලේ දිස්ත්‍රික්කය තුළ සංවිධානය කළ වැඩසටහන සඳහා අළුගොල්ල, දඹුල්ල, ගලේවෙල හා දේවහුව යන ප්‍රදේශයන්හි ගොවි කාන්තාවෝ 400ක් පමණ සහභාගී වූහ. මෙම වැඩසටහන් මාලාව සඳහා ආයතනයේ සම්පත් දායකත්වය ලබා දුන්නේ මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශයේ ප්‍රධානී එස්.එම්.ඒ සමරකෝන් මහතා සහ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරීන් වන එච්.එම්.ජේ.කේ හේරත්, පී.සී.ජේ ද සිල්වා සහ පර්යේෂණ නිලධාරී සංගීත් ප්‍රසාද් ප්‍රනාන්දු යන මහත්වරුන්ය.



# ගොවි සංවිධාන සවිබල ගැන්වීමේ පුහුණු වැඩසටහන

**ගොවි** සංවිධාන නායකයින් සවිබල ගැන්වීමේ පුහුණු වැඩසටහන් කිහිපයක් මොණරාගල සහ මාතලේ යන දිස්ත්‍රික්කයන්හි දී පැවැත්විණි.

මාතලේ දිස්ත්‍රික්කයේ අළුගොල්ල, දඹුල්ල, ගලේවෙල, දේවහුව, ලග්ගල, හුණු කැට ඇල හා පල්ලෙපොල ගොවිජන සංවර්ධන බල ප්‍රදේශ 07ක් ආවරණය වන පරිදි මෙම වැඩසටහන් සංවිධානය විය. මොණරාගල දිස්ත්‍රික්කයේ බුත්තල, දඹගල්ල, අලුත්වැව සහ මැදගම යන ප්‍රදේශයන්හි පැවති වැඩසටහන් තුළින් ගොවි සංවිධාන නායකයින් 360කට ආසන්න පිරිසක් පුහුණු කරවනු ලැබිණි. මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශයේ ප්‍රධානී එස්.එම්.ඒ සමරකෝන් සහ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී එච්.එම්.ජේ.කේ හේරත් යන මහත්වරු මෙම පාඨමාලාව මෙහෙය වූහ.

## කෘෂිකාර්මික පුරාවිද්‍යා ස්ථාන කළමනාකරණය හා සංරක්ෂණය පිළිබඳ අන්තර්ජාතික සමුළුවට HARTI නියෝජිතයින්

**චීනයේ** බීජිං නුවර පැවති කෘෂිකාර්මික පුරාවිද්‍යා ස්ථාන කළමනාකරණය හා සංරක්ෂණය පිළිබඳ අන්තර්ජාතික සමුළුවට හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය නියෝජනය කරමින් නිලධාරී පිරිසක් සහභාගී වූහ.

සමුළුව ජුනි මස 09 දින සිට 29 දින දක්වා චීනයේ දී පැවැත්වුණු අතර ශ්‍රී ලංකාව, කාම්බෝජය, පැපුවා නිව්ගිනියාව, සීෂෙල්ස් රාජ්‍යය, ඊජිප්තුව, ඉතියෝපියාව ඇතුළු රටවල් ගණනාවක නියෝජිතයෝ මෙ සඳහා සහභාගී වූහ. ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සමුළුව සඳහා අප ආයතනයේ නියෝජිතයින් ද ඇතුළුව 10 දෙනෙක් සහභාගී වූහ.



# HARTI පුවත්



## මිත්‍රත්වය තහවුරු කළ බක්මහ උළෙල

**හෙක්ටර්** කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ සුබ සාධක සංගමය විසින් සංවිධානය කළ සුහද බක්මහ උළෙල බක් මස 25 වෙනි දින ආයතන පරිශ්‍රයේ දී පැවැත්වුණි.

කණා මුට්ටිය බිඳීම, කඹ ඇදීම, හැන්ද මත දෙහි ගෙඩිය තබා ගෙන යාම වැනි ජන ක්‍රීඩා විනෝද ක්‍රීඩා රැසකින් බක්මහ උළෙල සමන්විත විය. දේශීය සංස්කෘතිකාංග මතු පරපුරටත් දායාද කිරීම මෙන්ම කාර්ය මණ්ඩලය අතර සුහදතාව වර්ධනය කිරීම ද අරමුණු කරගත් බක් මහ උළෙලට ආයතනයේ සියලුම කාර්ය මණ්ඩලය සහභාගී විය.



## ගංවතුර සහනාධාර බෙදා දීමේ වැඩසටහන

**පසුගිය** මැයි මස තුළ දිවයිනට බලපෑ දරුණු ගංවතුර තත්ත්වය නිසා අවතැන් වූ පිරිස් වෙනුවෙන් කඩිනම් ආධාර ලබා දීමේ වැඩසටහන් කිහිපයක් සුබ සාධක සංගමය, පොදු සේවක සංගමය ද ඇතුළු කාර්යමණ්ඩලය විසින් සංවිධානය කර තිබුණි.

ගංවතුරෙන් අවතැන් වූ කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ජනතාව වෙනුවෙන් ආහාර පාර්සල් 500ක් බෙදා දීම හා ගංවතුරෙන් විපතට පත් ආයතනයේ සේවක මහත්ම මහත්මීන් 14 දෙනෙකුට ප්‍රමාණවත් වියළි ආහාර පාර්සල් බෙදා දීම මෙහිදී සිදු කෙරිණි.




## ජාත්‍යන්තර වෙසක් දින සැමරුම

**ජාත්‍යන්තර** වෙසක් දිනයට අදාළව විජේරාම වෙසක් කලාපය තුළ සංවිධානය වූ පිංකම්වලට සමගාමීව අප ආයතනය විසින් ද වැඩසටහන් කීපයක් සංවිධානය කෙරුණි.

ධර්ම දේශනාමය පුණ්‍ය කර්මය, වෙසක් පහන් කුඩු තරඟය සහ බැතිමතුන් වෙනුවෙන් සංවිධානය කළ කඩල දන්සැල ඒ අතර කැපී පෙනේ. සුබසාධක සංගමයේ සහ ආයතන කාර්ය මණ්ඩලයේ ශ්‍රම දායකත්වය හා මූල්‍ය පරිත්‍යාගය මෙම කටයුතු සඳහා ලැබුණි.

# නව ප්‍රකාශන

පහතරට තෙත් කලාපයේ කුඹුරු බිම් වී වගාව සඳහා ශක්‍යතාවය අනුව වර්ගීකරණය කිරීම

ගොවි ජනතා 18 – 19 වෙළුම්

කමනලම් (ගොවිජනතා දමිළ කලාපය)

Present Status and Future Prospects of Non-Farm Employment (NFE) in the Mahaweli Area

An Evaluation of Mobile Based Market Information Systems in Sri Lanka

Adoption and Soil Conservation Measures: Case of Upper Watershed Management Project (UWMP)


Present Situation and Prospects of Cinnamon Industry in Sri Lanka

සියලු විමසීම්

## ගොවි කටයුතු පුවත් හසුන


අධ්‍යක්ෂ

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
අංක 114
විජේරාම මාවත
කොළඹ 07


























**සම්පාදනය :**

**වසන්ති චතුරංගනී රාජපක්ෂ**

**ප්‍රචාරණ හා ප්‍රකාශන නිලධාරිනී**

**නිර්මාණකරණය :**

**උදේනි කරුණාරත්න**

ගොවිකටයුතු පුවත් හසුන
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ ප්‍රචාරණ හා ප්‍රකාශන ඒකකය

මුද්‍රණය : හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ මුද්‍රණාලය